# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/43 - 2010 මාර්තු 05 වැනි සිකුරාදා - 2010.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය යටතේ සකස් කර, 2009.05.14 දින අංක 1601/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද නියෝග මාලාව, එකී ප්‍රඥප්තියේ 24 (III) හි විධිවිධාන අනුව වයඹ පළාතේ, පළාත් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදුව, එකී පළාත් සභාව විසින් 2009.11.03 දින පහත සඳහන් සංශෝධනයන් සහිතව සම්මත කරනු ලැබූ බව ද, එකී සංශෝධනයන් වයඹ පළාතේ, පළාත් සභාව සම්මත කරනු ලැබූ 2009.11.03 දින සිට ක්‍රියාත්මක වන බවද, සියළු දෙනාගේ දැනගැනීම සඳහා පළකර සිටිමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර,
සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන
සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය.

2010 පෙබරවාරි මස 19 වැනි දින,
කුරුණෑගල දී ය.

01. නියෝග මාලාවේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. *නියෝග මාලාවේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම*

(අ) නියෝග මාලාවේ 3.II වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන් ද ,

3.II 2008.07.28 දින සිට 2009.09.30 දක්වා සේවයට බැඳුනු සේවකයින්, අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා තත්කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියා වෙත අධ්‍යක්ෂවරයා විසින් නියම කරන කාලයක් තුළ ඉදිරිපත් කළ යුතුය.

(ආ) නියෝග මාලාවේ 3.III වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන් ද,

3.III 2009.10.01 දින සිට සේවයට බැඳෙන සේවකයෙකු තමා සේවයට බැඳෙන දින සිට දින 90ක කාලයක් ඇතුළත දී, අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

1A - PG 001126 — 350 (2010/03)

(ඇ) 3.III. වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ද,

3.IV. මෙම නියෝග මාලාවේ 2.II යටතට ගැනෙන සේවකයින් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අදාල අනුමැතිය ලබාගෙන, මෙම නියෝග නිකුත් වූ දින සිට වර්ෂයක කාලයක් තුළ, තත්කාර්යය සඳහා බලය පවරා ඇති නිලධාරියා වෙත අදාල ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

නියෝග මාලාවේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

02. නියෝග මාලාවේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) 4.IV වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් ද,

4.V. එවැනි යම් ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ අධ්‍යක්ෂවරයා විසින් ලබාදෙනු ලබන යම් තීරණයක් පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයෙකුට ප්‍රඥප්තියේ 18 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අභියාචනා මණ්ඩලයට, එකී 18 වන වගන්තියේ විධිවිධාන පරිදි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

4.VI. ප්‍රඥප්තියේ 18 වන වගන්තිය අනුව පත් කරනු ලබන අභියාචනා මණ්ඩලයට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය.

නියෝග මාලාවේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

03. නියෝග මාලාවේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) 8 වන වගන්තියට පසුව "වැටුප් රහිත නිවාඩු ලබා ඇති විට " යන පැති සටහන යටතේ සඳහන් නියෝගය 8.I ලෙස අංක කිරීමෙන් ද,

(ආ) ඉක්බිතිව පහත දැක්වෙන ඡේද ඇතුලත් කිරීමෙන් ද,

8.II. නියෝග මාලාව නිකුත් කරන අවස්ථාවේ සිට 2009.09.30 දක්වා විදේශගත වූ සේවකයින්, ඔවුන් නැවත දිවයිනට පැමිණි දින සිට දින 60ක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

8.III. යම් කිසි සේවකයෙකු කුමන හේතුවක් මත හෝ වැටුප් රහිත නිවාඩු ලබා සිටින අවස්ථාවක දී, ඔහුගේ දායක මුදල් අය කිරීම එම කාලයට අදාලව සිදු නොවිය යුතු අතර, එම වැටුප් රහිත සේවා කාලය විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ද ගණන් නොගත යුතුය.

නියෝග මාලාවේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

04. නියෝග මාලාවේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) 16 වැනි වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන ඡේදය ඇතුලත් කිරීමෙන් ද,

16.I හිඟ වැටුප් ගෙවීමකින් තොරව දායකයා නැවත සේවයේ පිහිටුවහොත්, එම වැටුප් රහිත කාලය විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ගණන් නොගත යුතු අතර, එම කාලය සඳහා දායක මුදල් ද අය නොකළ යුතු ය.

03-737

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.